**මිහින්තලේ ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 09 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 11 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 30 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය**
**-------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**-----------------------**

**(අ)** සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ලෙස නිශ්චය කරන ලද එකතුව රු.1,338,190 ක්වූ උසාවි දඩ, කඩකුලී හා වෙළඳ අයිතිය බදුදීමේ ආදායම් ගිණුම්ගත කර නොතිබුණි.

**(ආ)** සමාලෝචිත වර්ෂය තුල රු.1,300,000 ක්වූ පෙර වර්ෂවලට අදාල හිඟ මුද්දර ගාස්තු ලැබීම් හිඟ ආදායම් ගිණුමට ගැලපීම් නොකිරිම හේතුවෙන් හිඟ ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**(ඇ)** 1990 වර්ෂයේ සිට 2013 වර්ෂය සඳහා වූ කාලවකවානුවට අදාල රු.296,946 ක්වූ විගණන ගාස්තු උපචිත වියදම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වූ ගෙවිය යුතු විගණන ගාස්තු ගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

**(ඈ)** රු.240,000 ක්වූ ට්‍රැක්ටර් ජල බවුසරය හා 2014 වර්ෂය තුලදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පරිත්‍යාග ලෙස ලැබුණු රු.715,713 ක් වටිනාකමැති සුදු යකඩ ජල බවුසරය මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳු ගිණුම්**

-------------------

**(අ)** මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් විෂයයන් 06 ක ශේෂය හා අදාල උපයෝගි ලේඛනවල දැක්වෙන ශේෂ සමඟ රු.7,005,142 ක වෙනසක් පැවතුණි.

**(ආ)** මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 ක ශේෂය හා ලෙජර් ගිණුම්වල පැවති ශේෂ සමඟ රු.2,262,209 ක වෙනසක් පැවතුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

**-------------------------------------**

එකතුව රු.40,888,216 ක්වූ ගිණුම් විෂයයන් 07 ක් සම්බන්ධයෙන් අයිතිය සනාථ කිරීමේ ලියවිලි/විස්තරාත්මක උපලේඛණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.4 නිරවුල් නොකළ ගිණුම්

----------------------------

මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ලැබිය යුතු ගිණුම් 06 කට අදාල එකතුව රු.1,202,122 ක් වු හර ශේෂද ගිණුම් විෂයයන් 06 ක එකතුව රු.46,613 ක් වු බැර ශේෂද නිරවුල් නොකර දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් අතිරික්තය රු.3,349,918 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.4,417,021 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

-----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.889,943 ක්වූ බදුකුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

203 වන අධිකාරය, මෝටර් වාහන පනතේ 2(1) වගන්තියේ විධිවිධාන වලට පටහැනිව සභාව සතු වාහන 03 ක් ලියාපදිංචි නොකර ධාවනය කරමින් පැවතුණි.

**3.2** **කොන්ත්‍රාත් පාලනය**

------------------------

(අ) පළාත් සභා ප්‍රතිපාදන යටතේ වෙන්කරදී තිබුණු රු.75,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුලදී පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් සභාව වෙත ලබාදී තිබුණද අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා සභාව විසින් පියවර ගෙන නොතිබුණි.

(ආ) ඇස්තමේන්තුගත වටිනාකම රු.985,483 ක් වූ මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘතියක් 2014 ඔක්තෝබර් මාසයේ නිම කළයුතු වුවත් 2015 ජුලි වන විටත් නිම කර නොතිබුණු අතර ඒ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට රු.398,166 ක් ගෙවා තිබුණි.

**04** **පද්ධති හා පාලනය**

---------------------

පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.

(ආ). ආදායම් පරිපාලනය.

(ඇ). වත්කම් කළමනාකරණය

(ඈ). ණයගැති හා ණයහිමි පාලනය.